## Abstract 30

# වර්තමාන බෞද්ධ සංවිධාන හා එමගින් ථේරවාදයට ඇතිවන බලපෑම

**ඒ. එම්. ප්‍රසාදි අප්සරා අදිකාරම්,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*apsaraprasadi89@gmail.com*

මහින්දාගමනයෙන් පසු බුද්ධ භාෂිතය එලෙස ම පවත්වාගෙන යමින් ථේරීය සම්ප්‍රදාය ගුරු කොටගත් භික්ෂූහු නිවන් මඟෙහි ලා කටයුතු කරන අතර කවර සමාජයක වුව ද කලින් කල විවිධ අවශ්‍යතා හේතු කරගෙන මතුවන සමාජ ප්‍රතිශෝධක ව්‍යාපාර දක්නට ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ **බොදුබල සේනාව, රාවණා බලකාය, සිංහලේ, සිහල හඬ** ආදී බොහෝ සංවිධාන දැකිය හැකි ප්‍රමුඛ හා ජනප්‍රිය සංවිධාන වේ. මේ සංවිධාන හේතුවෙන් මෙතෙක් මැනවින් පැවත ආ ථේරවාද බෞද්ධ සම්ප්‍රදායයේ පැවැත්මට බලපෑමක් වන්නේ ය යනුවෙන් මතයක් ද ඒවා ලක්දිව බුදුසමයයේ ආරක්ෂාවට පිටුබලයක් වේ යනුවෙන් මතයක් ද සමාජය තුළ තහවුරු වෙමින් පවතී. එමෙන් ම එම සංවිධානයන්හි ක්‍රියා කලාපයන් ථේරවාදී භික්ෂු සම්ප්‍රදායයට බලපෑමක් ඇති වන්නේ නම් එය යහපත් බලපෑමක් ද අයහපත් බලපෑමක් ද යන්න පිරික්සීම මෙහි පර්යේෂණ ගැටලුව යි. ඇතැම්හු ථේරවාදී බුදුදහම, ශාසනය මෙන් ම සිංහලයා වැනසීමට විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටිති. එය දේශීය මෙන් ම විදේශීය කුමන්ත්‍රණයන්ගෙන් සැදුම් ලද්දකි. වර්තමානයේ නන් දෙසින් නොයෙක් බුදුවරු පහළ වීම, සෝවාන් වීම වෙනුවෙන් සහතික පිරිනැමීම යනාදී නොයෙක් අක්‍රමිකතා සිදුවේ. ථේරීය භික්ෂුත්වය කෙලෙසීමටත් සැදැහැවත් ජනයා භික්ෂූන්ගෙන් දුරස් කරමින් ලාංකේය බෞද්ධයන්ට අනන්‍ය වූ සිංහල ජාතිකත්වය දුර්වල කිරීමත් මෙහි එක් අරමුණකි. ලාංකේය බෞද්ධ සමාජයේ පවත්නා මෙම ගැටලු විසඳීමට විවිධ පිරිස් සංවිධානය වීම නිරායාසයෙන් සිදු වේ. මෙම සංවිධාන මගින් ථේරවාදී බුදුදහමට යහපතට වඩා අයහපතක් සිදුවේ යැයි බෞද්ධ හා අබෞද්ධ ඇතැමුන්ගේ චෝදනාව යි. රට, ජාතිය හා ආගම ව්‍යසනාපන්න අවස්ථාවන්හි දී ඉන් ගොඩ ඒම සඳහා භික්ෂුව මුල් වී නායකත්වය සැපයීම ශ්‍රී ලාංකික සමාජයට පමණක් අනන්‍ය වූ ලක්ෂණයකි. එහෙත් පොදු සමාජය විසින් වත්මන් භික්ෂුව ඊට මැදිහත් වන ආකාරයෙහි දෝෂ පමණක් ඉස්මතු කොට පෙන්වීමත් සිදුවන විපත්තීන්ට පිළියම් ගැනීම මන්දගාමී වීමත් කවර හේතු නිසා සිදු වන්නේ ද යන්න පුළුල් සාකච්ඡාවකට බඳුන් විය යුත්තකි.

**ප්‍රමුඛ පද :** ජාතික ව්‍යසන, ථේරීය සම්ප්‍රදාය, බෞද්ධ සංවිධාන, ශ්‍රී ලංකාව